කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
(බාහිර) - 2008

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ දර්ශනය -BUPH- E2015

බෞද්ධ මනෝ විග්‍රහය හා ආචාර ධර්ම

<u>ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි    කාලය : පැය 03 යි

---

01. මනෝවිද්‍යාවෙහි විෂය ක්ෂෙත්‍රය සැකෙවින් හඳුන්වා බෞද්ධ මනෝ විශ්ලේෂණයෙහි සුවිශේෂත්වය ප්‍රකට කරන්න.

02. බුදුදහමෙහි විස්තර කෙරෙන සඤ්ජානන ක්‍රියාවලිය <u>මධුපිණ්ඩික</u> සූත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න.

03. ''බුදුදහමෙහි සඳහන් වන පරිදි පුද්ගල පෞරුෂය හුදෙක් කායික ගතිලක්ෂණවලට වඩා මානසික ගති ලක්ෂණ මත පදනම් වූවකි.'' සාකච්ඡා කරන්න.

04. බෞද්ධ සූත්‍ර දේශනාවන්හි ''මනො'' සහ ''විඤ්ඤාණ'' යන පද අර්ථවත් කොට ඇති ආකාරය පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් කරන්න.

05. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව භාවනාව සිතෙහි සමබරතාව රැකීම සඳහා ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

06. සදාචාර ධර්ම පද්ධතියක අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණ බෞද්ධ සදාචාරධර්ම පද්ධතිය ඇසුරෙන් පැහැදිලි කරන්න.

07. සදාචාරාත්මක ක්‍රියා ඇගයීමේ දී බෞද්ධ ඉගැන්වීම් උපයෝගි කොට ගනු ලබන නිර්ණායක හඳුන්වා දෙන්න.

08. අයිතිවාසිකම් වලට වඩා සමාජය තුළ යුතුකම් ඉටුකිරීමේ වැදගත්කම බෞද්ධ ඉගැන්වීම් මගින් අවධාරණය කොට ඇති ආකාරය පෙන්වා දෙන්න.

09. තම තීරණ ක්‍රියාත්මක කිරීමට මිනිසාට ඇති නිදහස බෞද්ධ ඉගැන්වීම් මගින් තහවුරු වන ආකාරය නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

10. නිර්වාණාවබෝධයෙහි ලා සදාචාරධර්ම පද්ධතියෙහි ඇති අදාළත්වය ප්‍රකට කරන්න.

**************************